# 1

# උපනිෂද්සාහිත්‍යය හැඳින්වීම

**බලදොර ඉන්දජෝති හිමි**

වෛදිකසාහිත්‍යකෘති පෙළේ වැදගත්ම කෘතිසමූහය ලෙස 'උපනිෂද්' යන්න හැඳින්වීම සාධාරණය. ඒ, ආරණ්‍යකවලින් මුල පිරුණු ඇතැම් මූල බීජ අවස්ථාවන් මුහුකුරා යමින් දර්ශනවාද රාශියකටත් එයින් භාරතීයචින්තනයේ අතිදූවැන්ත චින්තන පෙරළියකටත් මූලික වුණු අදහස් අන්තර්ගත කෘති පෙළක් බැවිනි.

## උපනිෂද් යනු

බොහෝ බටහිර විචාරකයන් මෙහි පදගතාර්ථය විමසීමේදී උප+√සද් (හිඳ ගැනීමේ) ධාතුවෙන් මෙය නිපන් බව පෙන්වමින් සමීපයේ හිඳගැනීම මෙහි අර්ථය බවත් උපනිෂද්ධර්මය සමීපයේ හිඳ උගත යුතු බැවින් මෙම නම යෙදෙන්නට ඇති බවත් දක්වීය. මෙයටම සම්බන්ධ වන අයුරින් දෙසෙන් (Deussen, 1919) මෙහි අර්ථය *රහසිගත අර්ථය, රහස්‍ය ඉගැන්වීම, රහස* බව දක්වීය. උපනිෂද්ධර්ම සාමාන්‍ය ජනයාට නො-ඉගැන්විය යුතු බැවින් ද රහසිගතව සිසුනට කියාදිය යුතු බැවින් ද *රාහස්‍යම්* යන පර්යාය වචනය උපනිෂද් යන්නට භාෂ්‍යයෙහි ද යොදා තිබේ. නුසුදුසු පුද්ගලයන් අතට පත්වීමෙන් එම ධර්මයට සිදුවිය හැකි හානිය වළක්වා ගැනීමට එලෙස රහසිගතව කියාදීමට උත්සාහ ගෙන ඇති බව පෙනේ. උපනිෂදයන් තුළ දැකිය හැකි "මේ අක්‍ෂරයෝගය ගුරුකුලයෙහි අවුරුද්දක්වත් නේවාසික

නොවූ, ගුරුවරයකු වීමට අකමැති, අතවැසි ශිෂ්‍යයකු නොවූ කිසිවකුට නො-ඉගැන්විය යුතුය" (ශ්වේත. III.2.6.9) වැනි ප්‍රකාශ එයට සාක්ෂ්‍ය දරයි. තව ද, "බ්‍රහ්මන් පිළිබඳව රැක ගත්තා වූ මෙම රහස්‍ය ඉගැන්වීම..." (ඡාඳ. III.5.2), "බ්‍රාහ්මණ සභාවකදී හෝ අවමඟුලක ශ්‍රාද්ධය පවත්වන විට හෝ යමෙක් මෙම පරම රහස අසන්නට සලස්වන්නේ නම්..." (කඨ. I.3.17), "වේදාන්තයේ දක්වෙන මෙම පරම රහස..." (ශ්වේත. VI.22), "මෙම ඉතා රහසිතගත වූ දෙය දරුවකු නොවන, ශිෂ්‍යයකු නොවන, සංසිඳුණු සිත් ඇත්තකු නොවන අයකුට හෙළි නොකරන්න" (මෛත්‍රී. VI.29) යන ඉගැන්වීම්වලින් ද මේ බව සනාථ වේ. එමෙන්ම කේන උපනිෂදයේ IV.7 සඳහා භාෂ්‍යය සැපයීමේදී ශංකර ද මෙම අර්ථය පිළිගත් බව පෙනේ.

උපනිෂද් යන පදයට අර්ථ දීමේදී වඩා වැදගත් වන්නේ ශංකර කඨෝපනිෂද්භාෂ්‍යය ආරම්භයේ දක්වන විග්‍රහයයි[1]. ඔහු දක්වන පරිදි √සද් යන මූලයට අර්ථ තුනක් ඇත. නිරුද්ධ කිරීම (විශරණ), ගමන් කිරීම (ගති) සහ පීඩා කිරීම (අවසාදන) යනුවෙන්ය. උප යන උපසර්ගය පෙරට යෙදී √සද් ධාතුවට ක්විප් ප්‍රත්‍යය යෙදී උපනිෂද් යන්න සෑදේ. ඒ අනුව උපනිෂද් යන්නට, අවිද්‍යාව හෝ මෝහය නිරුද්ධ කරන්නා වූ, පරම යථාර්ථය වෙත ගමන් කරන්නා වූ සහ සංසාර බන්ධනයට පීඩා කරන්නා වූ යන අර්ථ තුනම ඇත. ශංකරම පරම ශ්‍රේෂ්ඨත්වය මෙයට ඇසුරු වී ඇතැයි යන අර්ථය ද තෛත්තිරීය උපනිෂද්භාෂ්‍යයේදී දක්වා ඇත[2].

ඕල්ඩර්න්බර්ග් සහ කීත් යන පඬිවරුන් දෙදෙන උපනිෂද් යන්නෙහි අර්ථය *උපාසන* යන්නට සමාන බව දක්වමින් ඒ තුළ වන්දනා කිරීම හෝ භක්තිය වැනි අර්ථයක් ඇති බව පෙන්වයි. කෙසේවෙතත්, ඔලිවෙල්ලේ (Olivelle, 1998) සඳහන් කරන්නේ *යථාර්ථය සමග ඇති රහස්‍යසම්බන්ධතාව, සමරූපී* බව මෙයින් කියැවෙන බවකි[3].

---

1 සදේර්ධාතෝර් විශරණගත්‍යවසාදනාර්ථස්‍යෝපනිපූර්වස්‍ය ක්විප්ප්‍රත්‍යයාන්තස්‍ය රූපමුපනිෂදිති.

2 උපනිසීන්නාං වා අස්‍යාං පරං ශ්‍රේයේ.

3 බලන්න 27 පිටේ දක්වෙන විස්තරය සහ අධෝලිපිය.



| ඍග්වේදයෙන් 10 කි | සාමවේදයෙන් 16කි | ශුක්ලයජුර්-වේදයෙන් 19කි | කෘෂ්ණයජුර්වේදයෙන් 32කි | | අථර්වවේදයෙන් 31කි | |
|---|---|---|---|---|---|---|
| අක්ෂමාලිකා<br>ආත්මබෝධ<br>ඓතරේය<br>කෞශිතකී<br>ත්‍රිපුර<br>නාදබින්දු<br>නිර්වාණ<br>බෘව්‍රිචා<br>මුද්ගල<br>සෞභාග්‍ය-<br>ලක්ෂ්මී | අව්‍යාක්ත<br>ආරුණේය<br>කුණ්ඩිකා<br>කේන<br>ඡාන්දෝග්‍ය<br>ජබාලදර්ශන<br>ජබාලී<br>මහත්<br>මෛත්‍රායණී<br>මෛත්‍රේයී<br>යොගචූඩමාණී<br>රුද්‍රාක්ෂජබාල<br>වජ්‍රසූචි<br>වාසුදේව<br>සන්‍යාස<br>සාවිත්‍රී | අද්වයාතරක<br>අධ්‍යාත්ම<br>ඊශාවශ්‍ය<br>ජාබාල<br>තරසර<br>තුරීයතිත<br>ත්‍රිශිඛීබ්‍රාහ්මණ<br>නිරාලම්භ<br>පරමහංස<br>පෛංගල<br>බෘහදාරණ්‍යක<br>භික්ෂුක<br>මණ්ඩලබ්‍රාහ්මණ<br>මන්ත්‍රිකා<br>මුක්තික<br>යඥාවල්ක්‍ය<br>සත්‍යායනී<br>සුබාල<br>හංස | අක්ෂි<br>අමෘතබිංදු<br>අමෘතානාන්ද<br>අවධූත<br>ඒකාක්ෂර<br>කඨ<br>කඨාරුද්‍ර<br>කාලග්නිරුද්‍ර<br>කාලිසංතාරා<br>කෛවල්‍ය<br>ක්ෂුරික<br>ගර්භ<br>තේජෝබිංදු<br>තෛත්තිරීය<br>දක්ෂිණාමූර්ති<br>ධ්‍යානබිංදු<br>පංචබ්‍රහ්ම<br>ප්‍රාණාග්නිහෝත්‍ර<br>බ්‍රහ්ම | බ්‍රහ්මවිද්‍යා<br>යජ්නිකී<br>(නාරායණ)<br>යෝගකුණ්ඩලී<br>යෝගතත්ව<br>යෝගශික්ෂා<br>රුද්‍රහෘදය<br>වරාහ<br>සරස්වතීරහස්‍ය<br>සර්වසාර<br>සුබරහස්‍ය<br>ස්කන්ද<br>ශරීරක<br>ශ්වේතාශ්වතර | ආත්ම<br>අථර්වශිඛා<br>අථර්වශිරා<br>අන්නපූර්ණ<br>කෘෂ්ණ<br>ගණපති<br>ගරුඩ<br>ගෝපාලතපනී<br>ත්‍රිපදවිභූති-<br>මහානාරයණ<br>ත්‍රිපුරතාපනී<br>දත්තාත්‍රෙය<br>දේවී<br>නාරද-<br>පරිව්‍රාජක<br>නෘසිංහතාපිනී<br>පරබ්‍රහ්ම<br>පරමහංස-<br>පරිව්‍රාජක | පශුපතබ්‍රහ්ම<br>ප්‍රශ්න<br>බෘහජ්ජබාල<br>භාෂ්මජබාල<br>භාවනා<br>මහාවාක්‍ය<br>මාණ්ඩූක්‍ය<br>මුණ්ඩක<br>රාමතාපනී<br>රාමරහස්‍ය<br>සරභ<br>සාන්ඩිල්‍ය<br>සීතා<br>සූර්ය<br>හයග්‍රීව |

1.1 වගු සටහන. උපනිෂද්ග්‍රන්ථ 108 වේදග්‍රන්ථ හතරට බෙදී යන අයුරු

මේ අනුව උපනිෂද් යන්නට අර්ථ අටක් දිය හැකි බව පෙනේ.

1. සමීපයේ හිඳ ඉගෙන ගන්නා ධර්මය
2. රහසිගත ඉගැන්වීම
3. මෝහය නිරුද්ධ කරන ධර්මය
4. පරම යථාර්ථය වෙත ගෙන යන ධර්මය
5. සංසාර බන්ධනයට පීඩා කරන ධර්මය
6. පරම ශ්‍රේෂ්ඨත්වය ඇසුරු කළා වූ ධර්මය
7. භක්තිය දනවන ධර්මය
8. යථාර්ථය සමග ඇති රහස් සම්බන්ධය හෝ සමරූපීබව හෙළි කරන්නා වූ ධර්මය

## උපනිෂද්ග්‍රන්ථ සංඛ්‍යාව

වෛදිකයුගයේ සිට පැවත ආ බ්‍රාහ්මණයා මූලික කරගත් යාගවිධි පිළිබඳ (කර්මමාර්ගයෙන්) සන්තුෂ්ටියට නොපත් ක්ෂත්‍රියයා එයට විරුද්ධව යමින් සත්‍යය වූ යම් තත්වයක් පිළිබඳ ගවේෂණයෙහි නියැළුණේය. ඥානයට මුල් තැන දෙමින් මනස මෙහෙයවා යම් සාර්ථකත්වයකට පැමිණීමට ප්‍රයත්න දැරූහ. පසුකාලීනව බමුණන්ට ද ඉගැන්විය හැකි තරමටම සාර්ථකත්වයක් ළඟා කර ගත්හ. පසුව බමුණෝ ද එම ධර්ම උගත්හ. එමෙන්ම ඔවුන්ගේ ඉගැන්වීම් අන්තර්ගත සංහිතා සහ බ්‍රාහ්මණග්‍රන්ථවලට යම් යම් සබඳතා ද සනිටුහන් කළහ. ඒ අනුව උපනිෂද් වෛදිකසාහිත්‍යයේ මුල් කෘතිවල නොවූ දර්ශනයක් අනුගමනය කළ ද එම මුල් කෘතිවලට යම් යම් සබඳතා ඇති කරලීමට බ්‍රාහ්මණයෝ සමත් වූහ. පසුව, උපනිෂද් චතුර්වේදයට වෙන් වශයෙන් අයිති ග්‍රන්ථ සහිතව විශාල ග්‍රන්ථාවලියකට අනුක්‍රමයෙන් පරිවර්තනය විය.

දැනට විද්‍යාමාන උපනිෂද් සංඛ්‍යාව 108කි. (මේ පිළිබඳව මත කීපයක් පළ වී තිබේ.) ඒ ඒ වේදයට සම්බන්ධ වන උපනිෂද් අනුව උපනිෂද් වර්ග කිරීමක් 1.1 වගුවේ දැක්වේ. මේවා අතර මුඛ්‍යෝපනිෂද් ලෙස විශේෂ අවධානයට භාජනය වන උපනිෂද් 12කි. එම ග්‍රන්ථ, වේදයට සම්බන්ධ වන ආකරාය ද සමගින් මෙසේය.



01. ඍග්වේදය- ඓතරේය උපනිෂද්ග්‍රන්ථය
02. සාමවේදය- ඡාන්දෝග්‍ය, කේන උපනිෂද්ග්‍රන්ථ
03. යජුර්වේදය- කඨ, තෛත්තිරීය, ශ්වේතාශ්වර, මෛත්‍රායණී, ඊශා බෘහදාරණ්‍යක උපනිෂද්ග්‍රන්ථ
04. අථර්වවේදය- මාණ්ඩූක්‍ය, මුණ්ඩක, ප්‍රශ්න උපනිෂද්ග්‍රන්ථ

## උපනිෂද්කෘතීන්ගේ කාලය

ඉන්දියානු ලේඛකයෝ බොහෝ විට උපනිෂද්කෘතිවල කාලය ඉතා ඈත අතීතයකට ගෙන යාමට උත්සාහ කරති. රාධාකෘෂ්ණන් පෙන්වා දුන්නේ එම කාලය පූ.ව.ව්‍ය. 1500 සිට පූ.ව.ව. 300 දක්වා වන බවයි. බී.ජී. තිලක් වැනි ඇතැම් ලේඛකයෝ ඍග්වේදයේ කාලය පූ.ව්‍ය.ව 5000 දක්වා අතීතයට ගෙන යාමට උත්සාහ ගෙන ඇත. ඔවුන්ගේ මෙම උත්සාහය පිටුපස ශාස්ත්‍රීයභාවයට වඩා ඇත්තේ ඉන්දියානුමානයය. එම කෘතිවල අන්තර්ගතය, භාෂාව සහ වෙනත් අභ්‍යන්තර සාධකත්, විශේෂයෙන්ම බෞද්ධ සහ ජෛන මූලාශ්‍රයයන් පරිශීලනයේදී හමුවන තොරතුරුත් විශ්ලේෂණය කළ විට මෙම කෘතිවල ඓතිහාසික බව කෙසේ වෙතත් වර්තමානයේ අපට හමුවන ස්වරූපය එතරම් පැරණි නොවන බව පිළිගත යුතුවේ.

මෛත්‍රී උපනිෂදයේ දැක්වෙන සටහනකින් බුදුදහම ගැන එහි කර්තෘ දැන සිටිය බව පෙනේ[1]. නමුත් එයින් කියැවෙන බුදුදහම බුද්ධකාලය ද නැතහොත් බුදුරජාණන්වහන්සේට පසුව ද යන්න නිශ්චය කර ගත නොහැක. උපනිෂද්කෘති අවස්ථා තුනකට වෙන් කර ගද්‍යයෙන් ලියවුණ පුරාණ-උපනිෂද් (early Upaniṣads), ගද්‍යපද්‍යමිශ්‍රව ලියවුණු මධ්‍යකාලීන-උපනිෂද් (middle Upaniṣads), සහ ගද්‍යයට මුල්තැන දෙමින් ලියවුණ පශ්චාත්කාලීන-උපනිෂද් (later Upaniṣads) යනුවෙන් දෙසෙන් දක්වයි (Deussen, 1906). මෛත්‍රී උපනිෂදය අයත් වන්නේ මෙයින් පශ්චාත්කාලීන උපනිෂද් යන්නටය. ඒ අනුව එයින් කියැවෙන කාලය බුද්ධකාලය කියා ගත හොත් ප්‍රාග්-බෞද්ධ ලෙස බොහෝ උපනිෂද් වර්ග කළ යුතු වේ. නමුත් එම කෘතිවල අන්තර්ගතයෙන් අපට එවැන්නක් නොපෙනේ.

1. 10 වන ලිපියේ එන විස්තරය බලන්න.

දෙසෙන්ගේ වර්ග කිරීම මෙසේය.

01. පුරාණ-ගද්‍යෝපනිෂද්
    - බෘහදාරණ්‍යක සහ ඡාන්දෝග්‍ය
    - තෛත්තිරීය
    - ඓතරේය
    - කෞශීතකී
    - කේන
02. මධ්‍යකාලීන-පද්‍යෝපනිෂද්
    - කාඨක
    - ඊශා
    - ශ්වේතාශ්වතර
    - මුණ්ඩක
    - මහානාරායණ
03. පශ්චාත්කාලීන-ගද්‍යෝපනිෂද්
    - ප්‍රශ්න
    - මෛත්‍රායණීය
    - මාණ්ඩූක්‍ය

දෙසෙන් කල්පනා කරන ආකාරයට බෘහදරණ්‍යක සහ ඡාන්දෝග්‍ය යනු පැරණිම උපනිෂද්කෘති වේ. ඒවා සමකාලීන ලෙස ඔහු අදහස් කරයි. දෙසෙන්ගේ මෙම පෙළ ගැස්වීමට පාදක කර ගන්නේ කෘතිවල අන්තර්ගතයෙන් පිළිබිඹු වන සාධකයන්ය. උදහරණයක් ලෙස ඡාන්දෝග්‍ය උපනිෂදයේ ධාතු 3ක් පමණක් දැක්වෙන අතර තෛත්තිරීය උපනිෂද්යේදී එම සංඛ්‍යාව 5 දක්වා ඉහළ යයි. මේ නිසා ඡාන්දෝග්‍ය මුලින් ලියැවී පසුව තෛත්තිරීය ලියැවුණු බව නිගමනය කරයි. මුණ්ඩක උපනිෂදයේ ශ්වේතාශ්වතර උපනිෂදය ගැන සඳහන් වෙයි. මේ නිසා එය පළමුව සම්පාදනය වී ඇත. තව ද, මහානාරයණ උපනිෂදයේ මුණ්ඩක උපනිෂදය ගැන සඳහන් වෙයි. ඒ අනුව එය මුණ්ඩක උපනිෂදයට වඩා තරුණය. කෙසේ වෙතත්, දෙසෙන් මෙම උපනිෂද් සම්පාදනය වුණු කාලය ගැන නිශ්චිතව යමක් නොකියයි. ඒවා බාහිර සාධක සමග සසඳ බලා ඓතිහාසිකව කුමන ස්ථානයක තැබිය හැකි ද යන්න ගැනත් ඔහු නිහඬය.



නමුත් ඔලිවෙල්ලේ (Olivelle, 1998) මෙයට වඩා ඉදිරියට ගොස් බෘහදාරණ්‍යක සහ ඡාන්දෝග්‍ය දෙක පූ.ව්‍ය.ව. 6 හෝ 7 සියවස්වලට අයත් විය හැකි බැවින් බුද්ධකාලයට පෙර බවත් අනෙක් පුරාණ උපනිෂද් තුන වන තෛත්තිරීය, ඓතරේය සහ කෞශීතකී ඇතැම්විට පූ.ව්‍ය.ව. 6 වන හෝ 5 වන සියවස්වලට අයත් විය හැකි බැවින් පූර්ව-බුද්ධකාලීන විය හැකි බව පවසයි. දෙවන යුගයට අයත් උපනිෂද් කෘති පූ.ව්‍ය.වර්ෂවල අවසාන සියවස් කීපයටත් ප්‍රශ්න සහ මාණ්ඩූක්‍ය උපනිෂද් යන කෘති ව්‍යවහාරවර්ෂයේ ආරම්භයටත් ඔහු ඇතුළත් කරයි . බුදුරජාණන්වහන්සේගේ කාලය ආසන්න වශයෙන් පූ.ව්‍ය.ව. 6 වන සියවස ලෙස ගත හොත්, ඔලිවෙල්ලේගේ මතයත් සැලකිල්ලට ගෙන, අපට නිශ්චිත වශයෙන් නිගමනය කළ හැක්කේ හුදෙක් බෘහදාරණ්‍යක සහ ඡාන්දෙග්‍ය යන උපනිෂද් පමණක් පූර්ව-බුද්ධකාලීන බවය.

නමුත් ඔහු ඉදිරිපත් කරන තවත් කාරණයක් ගැන අප අවධානය යොමු කළ යුතුය. එනම් මෙම කෘති වරින් වර සංස්කරණය වී ඇති බැවින් එකම කෘතිය තුළ ඇතැම් කොටස් වඩා පැරණි වන බවය. මෙම කාරණය තවදුරටත් මෙසේ පැහැදිලි කර ගත හැකිය. බෘහදාරණ්‍යක උපනිෂදයේ කාශී අගනුවර කර ගත් අජාතශත්‍රැ රජු ගැන සඳහන් වෙයි. කාශී යනු බරණැස්නුවර වන අතර මෙම රාජධානිය ඒ අනුව මගධයය. බෞද්ධකෘතිවල අජාතසත්තු ලෙස ද බ්‍රාහ්මණකෘතිවල අජාතශත්‍රැ ලෙස ද ජෛනකෘතිවල ජීයසත්තු ලෙස ද දැක්වෙන්නේ එකම රජකෙනෙකි. එනම් බිම්බිසාර රජුගේ පුතාය. බෞද්ධමූලාශ්‍රයයනට අනුව ඔහු රජ වන්නේ බුදුරජාණන්වහන්සේගේ ජීවිතයේ අවසාන සමයේය. ඒ අනුව බෘහදාරණ්‍යක උපනිෂදය අපට ස්ථාන ගත කළ හැක්කේ අවසන් බුදුවස් කීපයට හෝ සම්බුද්ධපරිනිර්වාණයට පසු හෝ පෙර ආසන්න කාලයකටය. ඒ අනුව එම සමස්ත කෘතියම නොව එහි කොටස් කීපයක් පමණක් පූර්ව-බුද්ධකාලීන බව කිව යුතුවේ. අනෙක් අතට, තෛත්තිරීය උපනිෂදයේ දැක්වෙන මූලධාතු 5 පිළිබඳව සැලකීමේදී පෙනීයන්නේ එම ඉගැන්වීම පූර්ව-බුද්ධකාලීන බවය. බුදුදහම තුළ පඨවි, ආපෝ, තේජෝ, සහ වායු යන මූලධාතු 4 ද ආකාස සහ විඤ්ඤාණ යන ධාතූන් සහිතව ධාතු 6ක් ගැන දැක්වේ (මජ්ඣිම නිකාය. ධාතුවිභඞ්ගසූත්‍රය). මේ අනුව පුරාණ ගද්‍යෝපනිෂද් ලෙස දැක්වෙන උපනිෂද්කෘති කීපයේ ඇතැම් කොටස් පමණක් පූර්ව-

බුද්ධකාලීන බව අපගේ නිගමනයයි. උපනිෂද්චින්තනයේ ආරම්භය බුද්ධකාලයට සමාන්තරව තරමක් පැරණිව ඉන්දියානු පොළොව මත ඉපදී ඇති අතර එකම චින්තනප්‍රවාහයක බ්‍රාහ්මණ මුහුණුවර උපනිෂද් ලෙසත් ශ්‍රමණ මුහුණුවර බෞද්ධ, ජෛන, චාර්වාක ලෙසත් වැඩුණු බව පිළිගැනීම වඩාත් බුද්ධිගෝචර බව පෙනේ.

ආචාර්ය හියුම් පඬිවරයා ප්‍රධාන උපනිෂද් තෙළෙස යනුවෙන් මහානාරායණ උපනිෂදය ද සහිතව එම මුල් ගොනු දෙකෙහි කෘති 12 විචාරයට භාජනය කොට ඇති අතර ශංකර බෘහදාරණ්‍යක, ඡාන්දෝග්‍ය, ඓතරේය, තෛත්තිරීය, ඊශා, කේන, කාඨක, ප්‍රශ්න, මුණ්ඩක, මාණ්ඩූක්‍ය සහ ශ්වේතාශ්වතර යන උපනිෂද් එකොළහට පමණක් භාෂ්‍ය සපයා ඇත. ඒ අනුව ඒවා වඩා විශ්වසනීය උපනිෂද් බව ඇතැමෙක් කල්පනා කරති[1].

## උපනිෂද් කර්තෘවරු

චින්තනයේ ඉහළ තල ස්පර්ශ කළ ඍෂිප්‍රජාවක දෘෂ්ටිය රැගත් ග්‍රන්ථ සමූහයක් ලෙස උපනිෂද් හැඳින්වීම නිවැරැදි වේ. ඔවුන්ගේ චින්තනය නිර්මාණ කුසුම් ලෙස පුබුදුවා ලූ ඔවුහු ඒ තුළින් තමා මතු වී පෙනීමට උත්සාහ නොකළහ. ආත්මාර්ථය නොසලකා පරාර්ථය සඳහාම කටයුතු කළ ඒ ප්‍රාඥයෝ යසස කීර්තිය නොතැකුවෝ වෙත්. සත්‍ය හෙළිකිරීම පමණක් ඔවුන්ගේ අරමුණ විය. මහීදාස, ඓතරේය, සාණ්ඩිල්‍ය, සත්‍යකාම ජාබාල, ජෛවලී, උද්දාලක, ශ්වේතකේතු, භාරද්වාජ, ගාර්ග්‍ය, ප්‍රතර්ධන, බාලකී, අජාතශත්‍රැ, ආරුණි, යාඥාවල්ක්‍ය, මෛත්‍රේය යනාදී චින්තක පිරිසක් උපනිෂද්කර්තෘවරු ලෙස හඳුනාගත ගත හැකි වුව ද සමස්ත උපනිෂද්ග්‍රන්ථාවලියේ සියලු කර්තෘවරුන් පිළිබඳ නිරවද්‍ය තොරතුරු සපයා ගැනීම අපහසු කාරණයකි.

---

1 ඉන්දියානු සාම්ප්‍රදායික පිළිගැනීම අනුව ශංකර විසින් භාෂ්‍යයන් සපයන ලද මෙම උපනිෂද් දහයේ ඓතිහාසික අනුපිළිවෙළ දක්වෙන්නේ ඊශා, කේන, කඨ, ප්‍රශ්න, මුණ්ඩක, මාණ්ඩූක්‍ය, තෛත්තිරීය, ඓතරේය, ඡාන්දෝග්‍ය, බෘහදාරණ්‍යක ශ්වේතාශ්වතර යනුවෙන්ය. මෙම කාල නිර්ණයේ පදනම පැහැදිලි නැත. ඇතැම් විට එය උපනිෂද්කෘතියේ ප්‍රමාණය දෙස බලා කළ විග්‍රහයක් විය හැක. කෘතියේ ප්‍රමාණය තුළින් එහි ඓතිහාසික බව ගැන කිසිවක් කිව නොහැක. එබැවින් මෙම මතය අද කිසිවෙකු පිළිගන්නේ නැත.



## උපනිෂද්හි අන්තර්ගතය

"උපනිෂද්හි මුල් බැස නොගත් බුද්ධධර්මය ඇතුළු කිසිදු භාරතීය චින්තන ක්‍රමයක් නොමැත" යනුවෙන් බ්ලූම්ෆීලිඩ් පඬිතුමා සිය Religion of the Veda කෘතියේ සඳහන් කිරීම තුළින් අපට පැහැදිලි වන කරුණක් නම් උපනිෂද්වල අන්තර්ගතය විෂය සමූහයක් තුළ දිවෙන බවයි.

උපනිෂද් දාර්ශනිකයන් අතර ද නානාවිධ විචාර පැවති බව පෙනේ. ආරුණි හා ඔහුගේ ශිෂ්‍යය යාඥාවල්ක්‍ය අද්වෛතවිඥානවාදීහුය. සමහරු ද්වෛතවාදීහුය. ඇතමෙක් ලෝකය හා බ්‍රහ්මන් එකක්ම යැයි පිළිගනිත්. මෙසේ නානාභේදගත දාර්ශනිකවිචාර ඇති උපනිෂද්ග්‍රන්ථ ඒ ඒ පරම්පරාවලට අයත් වූවෝ කට පාඩමෙන් රැගෙන ආහ. මේ එක් එක් ශාඛාවක් ගෙන බලතහොත් එහි අද්වෛතවාදයට හෝ ද්වෛතවාදයට ප්‍රධානත්වය දී නැති බව පෙනේ. එසේම එක් දාර්ශනිකයෙකුගේ ප්‍රධානත්වයක් ද නැත. එහෙයින් ඒ ඒ වේදශාඛාවන්හි ප්‍රධාන ආචාර්යවරුන්ගේ සියලු දාර්ශනිකමතවල සංග්‍රහය උපනිෂද් යැයි කිව හැකිය. හැම බ්‍රාහ්මණයකු විසින්ම ස්වකීය පරම්පරාවට අයත් මන්ත්‍ර බ්‍රාහ්මණ ආරණ්‍යක උපනිෂද් හා ව්‍යාකරණාදිය ධාරණයෙන් උගත යුතු හෙයින් උපනිෂද්සංග්‍රහ සන්සන්දනය කොට බලන කල්හි මෙසේ මතභේද සහිත වීම සහේතුකය.

(ධම්මරතන හිමි සහ පඤ්ඤාලෝක හිමි, 1969. පි.184)

මේ ග්‍රන්ථයන්හි ඇතුළත් වන හැම ඉගැන්වීමක්ම එක හා සමාන වූ වැදගත්කමකින් යුක්ත නොවේ. ඇතැම් ඒවා චින්තාමය වූ ක්ෂණික ආලෝකයන් පමණි. සමහරක් ඉතා සුළු අදහස්ය. තවත් සමහරක් ඉතා පැරණි යුගයෙන් නොනැසී පැවත එන අදහස්ය. උපනිෂද් මුනිවරයාට අවශ්‍ය වූයේ පාරමාර්ථික තත්වයෙහි යථාස්වරූපය නිර්මාණය කිරීමය. සර්වඥත්වය ලබා ගැනීමය. 'යමක් උගත්විට සියල්ලම දතුයේ වේ නම් ඒ උගැන්ම කුමක්ද?' 'බහුත්වයට යටින් ඇති ඒකත්වය කුමක් ද?' 'අනිත්‍ය ප්‍රවාහය යටින් පවත්නා නිත්‍යය වූව කුමක් ද?' 'පුද්ගලයා පිළිබඳ පරම හරය කුමක් ද?' 'විශ්වය පිළිබඳ පරම හරය කුමක් ද?' 'පුද්ගලාත්මය හා විශ්වාත්මය අතර පවත්නා සම්බන්ධය කුමක් ද?' මේ දෙක දෙකක් ද?' එකක්ම ද?' මේ දෙකෙහි ඇති භේදය කුමක් ද?' 'මේ දෙක අභේද ව්‍යවහාරයෙන් ගත හැකි ද? ගත යුතු ද?' භේද හා අභේද වශයෙන් ගත යුතු ස්වරූප මේ පාරමාර්ථික උභය

තත්වයන් පිළිබඳව දක්නට ලැබේ ද?' යනාදී ප්‍රශ්න ගැන කැරෙන විමසීම් උපනිෂදයන්හි දක්නට ලැබේ. උපනිෂද් දාර්ශනිකයෝ බාහිර ලෝකයෙන් අභ්‍යන්තරයට විමර්ශනාක්ෂිය යොමු කිරීමෙහි නිරත වූහ. ඊශ්වර ඉන්ද්‍රියයන් බැහැරට යොමුකර මිනිසා තනා ඇති හෙයින් බාහ්‍ය විෂයවස්තූන් මිස අභ්‍යන්තරාත්මය මිනිසාගේ නෙතට නොගැටෙන බව කඨෝපනිෂදයෙහි සඳහන් වේ. එහෙත් ඇතැම් ධීරයෙක් ප්‍රත්‍යගාත්මය දැකීම සඳහා අභ්‍යන්තරයට මනස යොමු කරයි. කර්තව්‍යය ද එයම විය යුත්ත උපනිෂද්දාර්ශනිකයෝ කල්පනා කරති (රේවත, 2009).

මේ අනුව උපනිෂදයන්හි අන්තර්ගතය පිළිබඳව සාකච්ඡා කිරීමේදී විෂය රාශියක් පිළිබඳව අවධානය යොමු කරන්නට සිදුවේ. අද්වෛතවාදය, කර්මය, ලෝකය, ලෝකනිර්මාණය හා සත්, අසත්, බ්‍රහ්මන් හා ආත්මන්, ඥානය, මනස, පුනර්ජන්මය, විමුක්තිය ආදී විෂය බහුත්වයක් උපනිෂද්හි සාකච්ඡා වේ. ඒවා පිළිබඳව ඉදිරි ලිපිවල සවිස්තරාත්මකව දැක්වෙන බැවින් එයින් කීපයක් පමණක් මෙහි ඉතා සැකෙවින් දැක්වේ.

උපනිෂද්වල ඇතුළත් විෂයයන්ගෙන් ප්‍රධානතම අංශය නියෝජනය කරන්නේ අද්වෛතචින්තාවෙහිය. *උපනිෂද්දර්ශනයක්* ගැනත් ඒ සියලු උපනිෂද්කෘතීන්හි පැතිර පවත්නා මූලික දෘෂ්ටිය ගැනත් අපට කතා කළ හැක්කේ මේ චින්තාව පදනම් කරගනිමිනි. මුල් යුගයේදී අන්‍යෝන්‍ය වශයෙන් වෙනස් අර්ථ දරා ඇති මේ පාරිභාෂික ශබ්ද දෙක උපනිෂද්සමයෙහි සමානාර්ථ ලෙස ඉදිරිපත් කොට ඇත. බ්‍රහ්මන්ම ආත්මන් බව උපනිෂදයන්ගේ මූලික ඉගැන්වීමයි. "ස වා අයමාත්මා බ්‍රහ්ම" (බෘහ. IV.4.5) යන ඉගැන්වීමෙන් එය පැහැදිලි වෙයි. මෙසේ උපනිෂද්දර්ශනය "බ්‍රහ්මන් වනාහි ආත්මන්මය" යන අදහස ප්‍රකාශ කරයි. මේ ඉගැන්වීම ප්‍රධාන ප්‍රස්තුත කීපයක් මඟින් ඉදිරිපත් කොට ඇත. ඒ ප්‍රස්තුත උපනිෂදයන්ගේ මහාවාක්‍යය, ශ්‍රේෂ්ඨවාක්‍යය ලෙස නම් කළ හැකිය. ඒවා මෙසේයි.

"තත් ත්වමසි" ඒ නුඹ වෙහි (ඡාඋ. VI.8.7)

"අහම් බ්‍රහ්මාස්මි" මම බ්‍රහ්ම වෙමි (බෘහ. I.4.10)

"සර්වං ඛල්විදං බ්‍රහ්ම" මේ සමස්තය වනාහි බ්‍රහ්මන්ය. (ඡාඋ. III.14.1)



මුළු මහත් උපනිෂද්දර්ශනයම මේ ප්‍රස්තුත මත ගොඩනැඟී ඇත. එමෙන්ම මුළු මහත් ඉන්දීයදර්ශනය නැමති ප්‍රාසාදයම උසුලා සිටින කුළුණු දෙක ලෙස මේ *බ්‍රහ්මන්* හා *ආත්මන්* සංකල්ප හැඳින්වීමට සමහර විචාරකයෝ පෙළඹෙති. මේ අනුව උපනිෂද්දාර්ශනිකයන්ගේ මුළු මහත් චින්තාව බ්‍රහ්මන් සහ ආත්මන් යන විකල්පනයන් දෙක වටා කැරකෙයි. උපනිෂද්දර්ශනය තේරුම් ගැනීමට නම් මේ විකල්පනයන් දෙක පිළිබඳව පැහැදිලි අදහසක් ඇතිකොට ගැනීම අවශ්‍යය. ඒ ඒ පුද්ගලයන්ගේ දෘෂ්ටීන්ට අනුව රුචි අරුචිකම්වලට අනුව ආත්මය යනු මෙය යැයි නොයෙක් අදහස් ඉදිරිපත් කර තිබේ. එබැවින් ආත්මය යනු ඇගයීමේ ගුණමූලික වචනයක් මිස නිශ්චිත වූ වස්තුවක් අඟවන්නක් නොවේ. නිත්‍යය වූ සුඛ සහගත වූ පදාර්ථයක් ඇතැයි සිතා එය ආත්මය නාමයෙන් හඳුන්වා තිබේ. වෛදිකයුගයේ ආරම්භ වූ ආත්ම සංකල්පය උපනිෂද් අවස්ථාවේදී සදාකාලික සර්වව්‍යාපී පදාර්ථයක් සේ සැලකුණි.

උපනිෂද්සංකල්පයන්ට අනුව ආත්මය දෙවැදෑරුම්ය. (1) ජගදාත්මය (පරමාත්මය හෙවත් ලෝකය පිළිබඳ සාරය) (2) ප්‍රත්‍යගාත්මය (පුද්ගලාත්මය හෙවත් පුද්ගලයා පිළිබඳ සාරය) යනුවෙනි. මෙයින් ජගදාත්මය යනු විශ්වය පිළිබඳ පරම සත්‍යය සේ සැලකුණි. බ්‍රහ්මන් නාමයෙන් ගැනෙන්නේ මේ ජගදාත්මයයි. ඒ ඒ පුද්ගලයා සතුව පරමාත්මයෙන් හෙවත් ජගදාත්මයෙන් ප්‍රත්‍යේකව හෙවත් වෙන්ව පවත්නා ආත්මය පුද්ගලාත්මයයි. මේ පුද්ගලාත්මයත් ජගදාත්මයත් දෙකක් නොව එකකි යනුවෙන් පිළිගැනීම අද්වෛත වාදයයි. මේ දෙක දෙකක් ලෙස සිතන්නේ අවිද්‍යාව නිසාය. ඒ අවිද්‍යාව පවත්නා තාක් කල් පුද්ගලයා දුක හා බැඳී සිටී. පුද්ගලාත්මය පරමාත්මය හා සහයුක්තතාවයට පත් කිරීම දුකෙහි නිමාවයි.

මේ අනුව ලෝකයේ සාරය වන බ්‍රහ්මන් හා පුද්ගලසාරය වන ආත්මන් පිළිබඳ දැන ඒ දෙක ඒකත්වයට පැමිණවීම සඳහා අවශ්‍ය වන දැනුම, විද්‍යාව ලෙස උපනිෂද්දාර්ශනිකයා සැලකීය. මෙම සාරයන් දෙක ඒකත්වයට පත්කිරීම පිළිබඳව පැහැදිලි කිරීම උපනිෂද්දර්ශනයේ ප්‍රධාන කාර්යභාරයයි. පුද්ගලයා මෙන්ම ලෝකය ද එකම සද්භාවයක (පැවැත්මක) ආවිර්භාවයක් නිසා දෙකම මූලික වශයෙන් එකක්මය. ආත්මයේ නියම ස්වරූපය දක්වමින් ප්‍රජාපති,

පාපමුක්ත වූ, අජර වූ, අමර වූ, නිශ්ශෝකී වූ, සාපිපාසා දෙකින් තොර වූ, ඇලුම් කළ යුතු දේට හැර අනික් කිසිවකට ඇලුම් නොකරන, සිතිය යුතු දේ හැර අන් කිසිවක් නොසිතන තත්වය ආත්මය වශයෙන් පවසයි (ඡාඋ. II.7.1). ඓන්ද්‍රියශරීරය සහ අනෛන්ද්‍රිය-ශරීරය යන දෙපක්ෂයම සත් කෙරෙන් ඇති වූ බව උපනිෂදයන් තවත් තැන්හි විස්තර කරයි. "ආත්මන්ගෙන් ආකාශය ද ආකාශයෙන් වායුව ද වායුවෙන් අග්නිය ද අග්නියෙන් ජලය ද ජලයෙන් පෘථිවිය ද ඇතිවිය[1]" (තෛඋ. II.1). මේ පංචමහාභූතසංකල්පය ශ්වේතාශ්වර, ප්‍රශ්න, මෛත්‍රායණී යන උපනිෂදයන්හි ඉදිරිපත් කෙරේ. ඓන්ද්‍රිය ලෝකය ගැන සඳහන් කරන්නේ ලොව මැවූ බ්‍රහ්මන් ඉන් පසුව එහි ප්‍රවිශ්ට වූ බවයි[2]. එහි පක්ෂියකු ලෙසින් ඇතුළු වී පසුව ඔහුගෙන් නොයෙක් ඓන්ද්‍රියසත්වවර්ගයා ජනිත විය. ඔහු ද්විපදපුරයන් ද චතුෂ්පද පුරයන් ද මැවීය. පළමුව පක්ෂියකු වී පුරුෂ තෙමේ එහි ප්‍රවිශ්ට විය[3]. මෙසේ බ්‍රහ්මන් වෙතින් ජනිත වන සත්වයෝ කාලපරිච්ඡේදය අවසානයේ බ්‍රහ්මන් තුළම නිලීන වෙන බව ද උපනිෂද්හි පැවසේ[4]. යමකින් මේ සත්වයෝ ජනිත වෙත් ද ඒ සත්වයෝ යමක් ආශ්‍රය කරගෙන ජීවත් වෙත් ද පෙරළා යන්නේ යමකට ඇතුළු වෙත් ද එය දැනගැනීමට කැමති වන්න. ඒ වනාහි බ්‍රහ්මන්ය. නමුත් මෙහිදී නිලීනත්වය මිස ඒකත්වයට පත්වීමක් අදහස් නොවේ. ඒකත්වයට පත්වීම නම් ආත්මන් බ්‍රහ්මන් තුළට එක්වීමයි. උපනිෂද්දාර්ශනිකයන් අපේක්ෂා කළ අවසාන මෝක්ෂය එයයි. උපනිෂද්දෘෂ්ටියට අනුව යමෙකු විසින් ප්‍රාර්ථනීය වූ උසස්ම අරමුණ බ්‍රහ්මන් සමග ඒකත්වයට පැමිණීමයි. මේ ඒකත්වයට පැමිණිය හැක්කේ අවිද්‍යාව නැති කිරීමෙනි. විද්‍යාවට පැමිණීමෙනි. විද්‍යාව නම් අද්වෛතභාවය අවබෝධ කර ගැනීමයි. ආත්මන්ම බ්‍රහ්මන් වන බව දැනගැනීමයි. "නෙළුම් පතෙහි දිය නොරැඳෙන්නා සේ මෙය දන්නා තැනැත්තා කෙරෙහි කිසිදු නරක ක්‍රියාවක් නොරැඳේ" යනුවෙන් ඡාඋ. IV.14.3හි දැක්වේ.

1 ආත්මන ආකාශස් ස්වහූතඃ ආකාශාද් වායු වායෝර් අග්නිඃ අග්නෙර් ආප් අද්භ්‍යඃ පෘථිවී.

2 තත් සෘෂ්ට්වා තද්ඒවානුපාවිශත් (තෛඋ. II.6.1)

3 පුරශ්චක්‍රෙ ද්විපදඃ - පුරශ්චක්‍රෙ චතුෂ්පදඃ /
පුරඃ ස පක්ෂි භූත්වා - පුරඃ පුරුෂ ආවිශත්// (බෘහ. II.5.18)

4 යතෝ වා ඉමාන් භූතානි ජාබන්තෙ යෙන ජානාති ජීවනති යත් ප්‍රයන්ති අභිසංවිසන්ති තත්විජිඥාසස්ව තද් බ්‍රහ්මෙති (තෛඋ. III.1.1)



උපනිෂදයන්හි එන ප්‍රායෝගික ඉගැන්වීම් හැඩ ගැසී ඇත්තේ බ්‍රහ්මසාක්ෂාත්කරණයට මඟ පෙන්වීම සඳහාය. මෙහි අරමුණ වී ඇත්තේ මානවචින්තනය සහ ක්‍රියා ද නිරවද්‍ය බවට පත් කිරීමයි. ඍග්වෛදිකදර්ශනයට අනුව සියලුම ප්‍රවෘත්තීහු නානාත්වයෙන් ප්‍රකට වන එකම සත්තාවය වෙයි (එකං සත් විප්‍රා බහුධා වදන්ති...). උපනිෂද්දාර්ශනිකයෝ මේ නිගමනය පිළිගෙන වඩාත් ප්‍රකට කිරීමට මහන්සි දරති. ආත්ම නම් වූ තමා පිළිබඳ සත්තාව පිළිබඳ දාර්ශනික-විශ්ලේෂණයක් මාර්ගයෙන් මේ ප්‍රශ්නයට ළඟා වන උපනිෂද්-දාර්ශනිකයෝ පුද්ගලයා පිළිබඳ පරම හරය වන ආත්මන් ද විශ්වය පිළිබඳ පරම හරය වන බ්‍රහ්මන් ද එකක් බවට අවසානයේදී නිගමනය කරති (රේවත, 2009).

ඖපනිෂදිකයෝ (එනම් උපනිෂද් කර්තෘවරු) ප්‍රශස්ත වූත් අග්‍රතර වූත් ඥානය ලෙස සලකන්නේ බ්‍රහ්මඥානයමය. එහිදී ඉන්ද්‍රියප්‍රත්‍යක්ෂය උසස් කොට නොසලකයි. ඉන්ද්‍රියන්ගෙන් ලැබෙන ඥානය මායාත්මකය යන අදහස ඊට හේතු වී ඇති බව පෙනේ. මැවීම් අර්ථයෙහි වැටෙන √මා - ධාතුවෙන් නිපන් *මායා* ශබ්දයෙන් සීමිත නැතහොත් අතාත්වික යන අර්ථය ගැනේ. ඉන්ද්‍රියයන්ගෙන් ලැබෙන අතාත්වික වූ සීමිත දැනීම ප්‍රතිභානයෙන් ලැබෙන තාත්වික වූ බ්‍රහ්මඥානයට වඩා බෙහෙවින් පහත් දැනීමක් බව උපනිෂද් මතය වේ. ඉන්ද්‍රියප්‍රත්‍යක්ෂයෙන් නොව භාවනාවෙන්ම ඥානය උදාවෙන බව මුණ්ඩක උපනිෂදයේ සඳහන් කරයි[1]. ඔහු ඇසින් ග්‍රහණය වනු නොලැබේ. වචනයෙන් හෝ අනෙක් ඉන්ද්‍රියන්ගෙන් හෝ තපසින් හෝ කර්මයන්ගෙන් හෝ ග්‍රහණය වනු නොලැබේ. එහෙත් කිසිවකුගේ බුද්ධිමයස්වභාවය *ඥානප්‍රසාදය* කරණකොටගෙන පිරිසිදු වේ ද හුදෙක් එකල්හිම හෙතෙම කලා විරහිත වූ භාවනාවෙන් දර්ශනය කරයි.

පුද්ගලයන් විසින් කරන ලද ක්‍රියාවන්ට අනුරූප වූ ප්‍රතිඵල ඒ ඒ අයට ලැබේය යන කර්මවාදී 'න්‍යාය' උපනිෂද් තුළින් පිළිගෙන ඇත. ඒ ප්‍රතිඵල ලැබෙන්නේ ඊට අනුව උපන තීරණය වීමෙන්ය යන්න

1 න චක්ෂුසා ගෘහ්‍යතේ නාපි වාචා -
නාන්‍යෛර් දේවෛස් තපසා කර්මනා වා/
ඥානප්‍රසාදේන විශුද්ධසත්වස් -
තතස්තු තම් පශ්‍යතෙ නිෂ්කලං ධ්‍යායමානඃ// (මුඋ. III.1.8)

පැවසෙන නිසා පුනර්ජන්මය ද පිළිගෙන ඇත. කර්මවාදය පිළිබඳ මෙම අදහස දියුණු වී වඩාත් පරිපූර්ණ කර්මවාදයක් උපනිෂදයන්හිදී හමුවේ. මිනිසා හොඳ ක්‍රියාවලින් හොඳ මිනිසෙක් ද නරක ක්‍රියාවලින් නරක මිනිසෙක් ද වන බව බෘහදාරණ්‍යක උපනිෂදයෙහි සඳහන් වේ (III.2.13). මේ නිසා අයෙක් හොඳ දේ කළ යුතුය. යහපත් අධිෂ්ඨානයන් ඇති කර ගත යුතුය. නිර්මල සිතින් යුත් මිනිසාට තමන් ආශා කරන ලෝක සහ වස්තූන් ලබා ගත හැක. මේ නිසා භූති නොහොත් ප්‍රකට බලය කෙරෙහි ආශාව දක්වන පුද්ගලයා ආත්මාවබෝධී තැනැත්තන් ඇදහිය යුතුය. අනුගමනය කළ යුතුය. පළිගැනීම, එකට එක කිරීම, අනවරාග්‍ර සංසාරයෙහි ගමන් කිරීමට හේතු වේ. දිව්‍ය, මනුෂ්‍ය, සත්ව හා උද්භිද රාජධානිය ද කර්මවාදයට යටත්ය (රේවත, 2009).

"පුද්ගලයකුගේ ක්‍රියාව හා චර්යාව අනුව හෙතෙම නැවත නැවත උත්පත්තිය ලබයි. පුණ්‍ය ක්‍රියාවෙන් උතුම් ලෙසත් පාපක්‍රියාවෙන් අධම ලෙසත් උපදී. කර්මයන්ට අනුවම ප්‍රතිඵල ලැබේ" (බෘහ. IV.4.5). මේ ජීවිතයෙහි කරන ලද ක්‍රියා හා චේතනා අනුව පසු ජීවිතයක ඵල ලැබෙන බව ඡාන්දෝග්‍ය උපනිෂදයෙහි සඳහන් වන්නේ මෙසේය.

> එබැවින් මෙහි ප්‍රසන්න ගති පැවතුම් ඇති අය වෙත් ද ඔවුහු ප්‍රසන්න ගර්භයකට එනම් බ්‍රාහ්මණගර්භයකට හෝ ක්ෂත්‍රියගර්භයකට හෝ වෛශ්‍යගර්භයකට හෝ පිවිසීමට බලාපොරොත්තු විය යුත්තාහ. එහෙත් දුරාචාරයෙහි යෙදී සිටින අය ඇත්නම් ඔවුහු අප්‍රසන්න ගර්භයකට එනම් සූනඛගර්භයකට හෝ වරාහගර්භයකට හෝ චණ්ඩාලගර්භයකට හෝ පිවිසීමට බලාපොරොත්තු විය යුත්තාහ.
>
> (ඡාඋ. V.10.7)

දුසිරිතෙහි ඇලී ගැලී සිටින අයට පහත් කුලයක් පමණක් නොව තිරිසන් යෝනිවල ද ඉපදීමට සිදුවන බව මෙයින් පැවසේ. උපනිෂද්-දර්ශනයේ තවත් විශේෂත්වයක් නම් ඒ ඒ උසස් පහත් ජන්මවල ඉපදීමට බලපාන එකම හේතුව කර්මය පමණක් නොව වෙනත් හේතු ද ඇතැයි දැක්වීමය. ඒ අනුව තමාගේ දැනීමේ ප්‍රමාණය ද (විද්‍යාව) අනාගත ජන්මය හැඩගැස්වීමට ඉවහල් වන බව කෞෂිතකී උපනිෂදයේ සඳහන් වේ.

> තමන් කළ ක්‍රියාවන් (කර්ම) අනුව තමන්ගේ දැනීම (විද්‍යාව) අනුව කෙනෙක් පණුවකු හෝ පළඟැටියකු හෝ මත්ස්‍යයකු හෝ පක්ෂියකු හෝ සිංහයකු හෝ වල් ඌරකු හෝ නාගයකු හෝ ව්‍යාඝ්‍රයකු හෝ මිනිසකු හෝ වෙනත් කෙනෙකු හෝ ලෙස නොයෙක් අවස්ථාවන්හි නැවත උපදිත්. (කෞෂි. I.2).



කෞෂිතකී උපනිෂදයට අනුව මරණයට අනතුරුව හැමදෙනාම චන්ද්‍රලෝකයට යති. ඉන් සමහර දෙනෙක් පිතෘමාර්ගය ඔස්සේ බ්‍රහ්මන් කරා යෙති. සෙස්සෝ තමන්ගේ ක්‍රියාවල ගුණය හා ඥාන-ශක්තිය අනුව මිනිසාගේ සිට කීටයා දක්වා වූ සිය ජීවිත කරා ආපසු පැමිණෙති (I.2.3). බෘහදාරණ්‍යකයට අනුව දේවයානයෙන් යන්නෝ ආපසු නොපැමිණෙති. පිතෘයානයෙන් යන්නෝ ආපසු පැමිණෙති.

යාග පැවැත්වීම ද පරාවිද්‍යා (වේදසංහිතා, බ්‍රාහ්මණ, වේදාංග) ඉගෙන ගැනීම ද බ්‍රහ්මත්වය අවබෝධ කර ගැනීමට සෑහේ යයි සිතමින් ක්‍රියා කරන අය නැවත නැවත සංසාරයෙහි ඉපදෙන බව මුණ්ඩක උපනිෂදයෙහි (I.2.7) කියැවේ. පැරණි උපනිෂදයන්ට පසුව රචිත යයි සැක කරනු ලබන මේ උපනිෂදයෙහි කඨෝපනිෂදයෙහි මෙන් බෞද්ධදර්ශනයේ ආභාසයෙන් ව්‍යාප්ත වූ කර්මය, සංසාරය යනාදී මත සඳහන් වේ. කඨෝපනිෂදයට අනුව පැටවුන් නොලබන මහලු වූ නිසරු එළදෙනුන් තෑගි කරන පුද්ගලයා ඉපදෙන්නේ ආනන්දයෙන් හෙවත් ප්‍රීතියෙන් තොර ලෝකවලය (I.3). මෙය වනාහි පණුවන්, කෘමීන් හා බඩ ගා ඇදෙන සතුන් ආදීන් ජීවත් වන ලෝකය විය හැකිය. බ්‍රහ්මන් සමග ඒකත්වය ලබා මෝක්ෂය අවබෝධ කරගත් තැනැත්තා ගැළවීම සඳහා කොහිවත් යා යුතු නොවේ. ඔහු මෙහිදීම මෝක්ෂය ලබයි[1] (බෘහ. IV.4.6) ආත්මයෙහි ස්වෛරීත්වය අවබෝධ කොට ගත් අය කිසිදු මාර්ගයක් ඔස්සේ ගමන් නොකරති. එහෙත් ක්‍රමමුක්තයෝ (ක්‍රමයෙන් උසස් බව ලබමින් බ්‍රහ්මන් කරා ළං විය යුතු අය) දේවයානය ඔස්සේ ගමන් කොට ක්‍රමානුකූලව උසස්වීම් ලබමින් මෝක්ෂයට පැමිණෙති. එය ක්‍රමමුක්ති මාර්ගය යනුවෙන් හැඳින්වේ (ඡාඋ. V.10.2). සාමාන්‍යව්‍යවහාරයේ 'දෙව්මිනිස් සැප කෙළවර නිවන් අවබෝධවීම' යනුවෙන් දැක්වෙන්නේ උපනිෂද්වල ඉගැන්වෙන මෙම ක්‍රමමුක්තිය වේ.

මේ අනුව සලකා බලන කල උපනිෂද් මුනිවරු කර්මයත් පුනර්ජන්මයත් පිළිබඳ පැහැදිලි අවබෝධයක නැතහොත් සාර්ථක ගවේෂණයක නියැළුණු බව පැහැදිලි වේ. නමුත් පුනරුත්පත්තිය

1 අත්‍ර බ්‍රහ්ම සමශ්නුතෙ

කර්මය යනාදී සංකල්ප හුදෙක් උපනිෂද් කාලයෙහි ඇති වූ ඒවා යයි සිතීම යුක්ති යුක්ත නොවේ. දාර්ශනික පදනමක් ඇතිව ස්ථිර වශයෙන්ම මේ මත මේ යුගයේදී විස්තර කෙරුණ නමුත් වෛදික කාලයේ සිට ආර්යන් අනෙක් රටවල මිනිසුන් මෙන් උත්පත්තිය හා මරණය පිළිබඳව ඇතිකරගත් යම් යම් අදහස් ක්‍රමයෙන් විකාශනය වී මෙසේ මුහුකුරා ගිය දර්ශනවාදයකට පරිවර්තනය වූ බව අවධාරණය කළ යුතුය. යම් කලකට ඉහත ඉන්දියාවේ ජීවත්ව තිබී යටපත් වූ කිසියම් දර්ශනසම්ප්‍රදායයක් තුළින් මෙම අදහස් නැවත කරළියට ආ බව ද ඇතැමෙක් පිළිගනිති.

පුනරුත්පත්තිය සිදුවන ආකාරය ද ක්‍රම කිහිපයකට විස්තර කළ තැන් උපනිෂදයන්හි හමුවේ. දළඹුවෙක් තණපතකින් තවත් තණපතකට මාරු වන්නාක් මෙන් මිනිසා ද සිරුරින් සිරුර ලබා ගන්නා බව බෘහදාරණ්‍යක IV.4.3. හි පවසා ඇත. මෙයට වඩා වෙනත් අයුරකින් පුනර්ජන්මය ගැන විස්තර කරන අවස්ථාවක් මෙසේය. "රන්කරුවා රන් කැබැල්ලක් රැගෙන එයට වඩා සුදුසු නව්‍ය ස්වරූපයකට පත් කරන්නාක් මෙන් ආත්මය වර්තමාන ශරීරය හැර දමා වඩා අලුත් වූ ද උචිත වූ ද ලෝකයට ගැළපෙන්නා වූ ද ස්වරූපයක් ලබා ගනියි" (බෘහ. IV.4.4). තවත් ක්‍රමයකට අනුව පුනර්ජන්මය සිදුවන අයුරු මෙසේය. "ප්‍රතිමාශිල්පියෙක් එක් ප්‍රතිමාවකින් ද්‍රව්‍ය ලබා ගෙන එයින් වඩාත් නව්‍ය වූ ද දර්ශනීය වූ ද ප්‍රතිමාවක් නෙළන්නාක් මෙන් ආත්මය ඉහාත්මයෙහි ඇති ශරීරය හැර දමා අවිද්‍යාවෙන් ද මිදී පිතෘන්ගෙන්, ගාන්ධර්වයන්ගෙන්, දෙවිවරුන්ගෙන්, ප්‍රජාපතිගෙන්, බ්‍රහ්මගෙන් හෝ වෙනත් සත්වයින්ගෙන් හෝ ලබාගත් වඩාත් නූතන වූ දර්ශනීය වූ ස්වරූපයක් මවා ගනියි" (කෞෂී. I.2 සිට). ආත්මය මරණින් පසු සියලු *ජීවශක්ති* එකතු කොට ශරීරය අත්හැර ඒ ශරීරයෙහිදී කළ කර්මවිපාකයනට අනුව උසස් වූ හෝ පහත් වූ හෝ ශරීරයකට ඒ සියල්ලම සමග එකතු වන බව ඇතැම් උපනිෂදයන්හි සඳහන් වේ (රේවත, 2009). පුනර්ජන්මය විග්‍රහ කිරීමේදී විවිධක්‍රම අනුගමනය කළ ද සියලුම උපනිෂද් පුනර්ජන්මය පිළිගෙන ඇත. විශේෂයෙන්ම ගර්භ උපනිෂද් වැනි කෘතියක මව්කුස තුළ කළලය වැඩෙන අයුරු ද විස්තර කර තිබීම මෙහිදී විශේෂයෙන් සිහිපත් කළ යුතුය.

සියලු ආගම්වල අත්‍යුත්කර්ෂවත් ප්‍රතිඵලය වන්නේ දිව්‍ය-මනුෂ්‍යාදී සියලුම ගතිවලදී අත් විඳින්නට සිදු වන අඩු ලුහුඬුකම්



දුක් දොම්නස් ආදියෙන් වැළකී සදාකාලික විමුක්තිය වන මෝක්ෂය ලබා ගැනීමයි. මෙහිදී පුද්ගලයා සම්පූර්ණයෙන්ම ක්ෂය වී උච්ඡේදයට පත්වීමක් සිදු නොවන බව උපනිෂදයන්ගේ පිළිගැනීමයි. ආත්මාර්ථකාමී හුදකලාවෙන් ඉවත් වී පෞද්ගලිකත්වය අතහැර සිය නාමරූපයන්ගෙන්[1] ඉවත් වී පරමාත්මයෙහි නිමග්න වීම උපනිෂද්හි සඳහන් මෝක්ෂයයි. ඡාන්දෝග්‍යයෙහි දක්වූ පරිදි ගංගාවක අනන්‍යතාව පවතින්නේ එය ගොඩබිම මතුපිට ගලා යන කල්හි පමණි. සාගරයට එක් වූ විට සියලුම ගංගාවෝ තම නාමරූපයන් අත්හරී. සයුර බවටම පත් වෙති. එසේම සත්වයා ද බ්‍රහ්මන් කෙරෙහි නිමග්න වූ පසු සිය නාමරූපයන් අත්හරියි. ඔහු එම විශ්වාත්මයෙහි නිමග්න වෙයි. (ඡාඋ. VI.10.1). ඡාන්දෝග්‍යයෙහිම VI.9.1ට අනුව මී මැස්සන් විවිධ වෘක්ෂයන්ගේ රසය ගෙන මී බැඳි විට එහි ඇත්තේ එකම රසයකි. එසේම සිංහ, ව්‍යාඝ්‍ර, වෘක, වරාහ, කීට, පතංග ආදී භේද දක්නට ලැබෙන්නේ සංසාරගාමී ආත්මයන්හිය. මෝක්ෂප්‍රාප්තිය ලද පසු නාමරූප වශයෙන් වෙන්ව ප්‍රඥායමාන වීම නවතියි. මෙය බ්‍රහ්ම සාක්ෂාත්කරණයයි. මෝක්ෂයයි (රේවත, 2009).

## උපනිෂද් ආචාරධර්ම

උපනිෂද් අධ්‍යයනයේ වැදගත්කම විමසීමේදී උපනිෂද්හි දාර්ශනික අර්ථයන් හැරුණු කොට ප්‍රායෝගික ආචාර මීමාංසාවට අදාළව ඉදිරිපත් කෙරෙන අදහස් සමුදාය ද උපනිෂද් පාඨකයාට තත් සමාජීය ආධ්‍යාත්මික තත්වය තේරුම්ගැනීමට මනා පිටිවහලක් සපයයි.

උසස් ආධ්‍යාත්මික මාර්ගයකට පිවිසීම සඳහා යහපත් හැසිරීම් රටාවක් අවශ්‍ය වේ. බෘහදාරණ්‍යක උපනිෂදයේ (V.2.1-3) සිත් ගන්නා සුලු ආඛ්‍යායිකාවක් මඟින් දමනය දානය, දයාව පිළිබඳ ඉතා වැදගත් විස්තරයක් සපයයි. ඡාන්දෝග්‍ය උපනිෂදයේ (III.17.4) තපස, දානය ඍජුකම, අවිහිංසාව, හා සත්‍ය වචනය ආධ්‍යාත්මික උන්නතියේ සාධනයන් වශයෙන් දක්වා ඇත. තෛත්තිරීය උපනිෂදයේ (I.2.1-3) ගුරු ගෙදරින් ආපසු යන විට ශිෂ්‍යයාට ඉතාමත් වැදගත් ශික්ෂාවන් සංග්‍රහයක් සිහි කර දී තිබේ. මේ ශික්ෂාවන් අතර මව,

1 මෙහි නාමරූප යනු බුදුදහමේ මෙන් දාර්ශනිකසංකල්පයක් නොව හුදෙක් හඳුනා ගැනීමට යොදන නම් සහ භෞතිකරූපයය.

පියා, හා ගුරුවරුන්ට සේවා කිරීම, ස්වාධ්‍යායචින්තනය (වේද පිළිබඳ චින්තනය) හා ධර්මයේ හැසිරීමට වැදගත් ස්ථානයක් ලැබී තිබේ. මෙහි *සත්‍යං වද* ඇත්ත කියන්න යන්නට සියලු උපදේශයන් අතර විශිෂ්ට ගෞරවයක් ලබා දී තිබේ. ඡාන්දෝග්‍ය උපනිෂදයේ (IV.4.1-5) සත්‍යකාම ජාබාලගේ කථාවෙහි සත්‍ය ප්‍රකාශ කිරීම පිළිබඳ මනා සැලකිල්ලක් දක්වා තිබේ. ප්‍රශ්නෝපනිෂදයේ බොරුකීමට නින්දාව (VI.1) සහ මුණ්ඩක උපනිෂදයේ (III.1.6) සත්‍යයට ප්‍රශංසාව කර ඇත. සත්‍යයෙන් පසුව තැන්පත් ගතිය (ශම) දමනය (දම) ආශාර තුරන් කිරීම (උපරති) ඉවසීම (තිතික්‍ෂා) හා එකඟ කිරීමට (සමාධාන) පැමිණීම එතරම්ම අවශ්‍යයි (බෘහ. IV.4.23). එහෙත් ඥානය ලැබීම සඳහා මූලභූත වූ ගුණයන් වන්නේ නුවණින් විමසීම (විවේක) හා විරාගී බව (වෛරාග්‍ය) වේ. යමෙකුට එකඟ බව, සත්‍යාසත්‍ය පිළිබඳ විමසීම, සතුට (ශ්‍රේය) හා ආදරය (ප්‍රේය) ගැන වාස්තවික තීරණයක් ගැනීම යන කරුණුවලින් තොරව ලෝකය පිළිබඳ වෛරාග්‍ය ඉපිදවිය නොහැක. එසේම බ්‍රහ්ම ප්‍රාප්තියේ ඉලක්කය දක්වා ඔහුට ඉදිරියෙන් සිටිය නොහැක. මුණ්ඩක උපනිෂදයේ (I.2.12) මේ ගුණයන්ට විශේෂ වැදගත්කමක්දී ඇත.
(ධම්මරතන හිමි සහ පඤ්ඤාලෝක හිමි, 1969. පිපි. 57-58).

## මූලාශ්‍රයයෝ


උපාධ්‍යාය, බී. (1999). *භාරතීය දර්ශනය.* පරි. හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි. ගොඩගේ ප්‍රකාශනː කොළඹ.

තිලකසිරි, ජේ. (1958). *වෛදික සාහිත්‍යය.* කොළඹː එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

ධම්මරතන හිමි, එන්. සහ පඤ්ඤලෝක හිමි, එච්, (1969). *භාරතීය දර්ශන.* කොළඹː සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

වීරසිංහ, එස්.ජී.එම්. (1992). *උපනිෂද් දර්ශනය.* කොළඹː ගොඩගේ සහෝදරයෝ.

රේවත හිමි, එන්. (2009). *ප්‍රශ්නොපනිෂද්.* කැලණියː කර්තෘ ප්‍රකාශන.





සෙනෙවිරත්න, සී. ඒ. ඩී. (1961). *උපනිෂද්.* කොළඹ.

- (2004). *The Bṛhadāraṇyaka Upaniśad.* Madras: Sri Ramakrishna Math.

Deussen P. (1906). *The Philosophy of Upanishads* (S. A. Gaden, Trans.). Edinburgh, England: T & T Clark.

Gambhirananda, Swami (2006a). *Aitareya Upaniṣad with the commentary of Śaṅkarācārya*, Trans. Kolkata: Advaita Ashrama

- (2006b). *Chāndogya Upaniṣad with the commentary of Śaṅkarācārya*, Trans. Kolkata: Advaita Ashrama.

- (2000). *Muṇḍaka Upaniṣad with the commentary of Śaṅkarācārya*, Trans. Kolkata: Advaita Ashrama.

Olivelle, P. (1998). *The Early Upaniṣads: Annotated Text and Translation.* New York: Oxford University Press.

Sarvananda, S. (2007). *Katha Upanishad*, Trans. Madras: Sri Ramakrishana Math